ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය**

# මාර්ග සංවර්ධන අධිකාරිය

# ලංසු ආරාධනයයි

## මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා සේවා සැපයීම

1. මාර්ග සංවර්ධන අධිකාරියේ **(RDA) ගම්පහ දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා** විසින් මාර්ග සංවර්ධන අධිකාරියේ **මීගමුව විධායක ඉංජිනේරු කොට්ඨාශය** වෙනුවෙන් පහත සේවා සැපයීම සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

| **කොන්ත්‍රාත් අංකය** | **විස්තරය** | **කාල සීමාව** | **ලංසු සුරක්ෂණය** | **සැපයිය යුතු කම්කරුවන් ප්‍රමාණය** |
|---|---|---|---|---|
| RDA/GAM/CE/TEN/2024/61 | මීගමුව විධායක ඉංජිනේරු කොට්ඨාශයට අයත් මීගමුව වැඩ ඒකකය සඳහා කොන්ත්‍රාත් පදනම මත නුපුහුණු කම්කරුවන්ගේ සේවය ලබා ගැනීම | මාස 6 යි | රු. 76,550.00 | 36 |

2. ක්‍රියාත්මක කරන නියෝජිතායතනය වන්නේ **මාර්ග සංවර්ධන අධිකාරියේ ගම්පහ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයයි.**
3. ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (NCB) අනුගමනය කරනු ලැබේ.
4. 2025.01.07 සිට 2025.01.27 දක්වා පෙ.ව. 09.00 සහ ප.ව. 03.00 අතර කාලය තුළ නැවත ගෙවනු නොලබන රු. 1180.00 (වැට් සහිත) අයදුම්පත් ගාස්තුවක් ගෙවා **ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය, 1 වන මහල, මිරිස්වත්ත, මුදුන්ගොඩ** වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට සම්පූර්ණ ලංසු ලේඛන කට්ටල මිලදී ගත හැකිය. ලංසු ලේඛනය මිලදී ගන්නා විට මුල් ගෙවීම් පත්‍රිකාව ඉදිරිපත් විය යුතුය.**2025.01.28 දින ප.ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් වේ.** ලංසු භාර ගැනීම අවසන් වූ වහාම විවෘත කෙරෙණු ඇත. ලංසු විවෘත කිරීමේදී පෙනී සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.
5. **සෑම ලංසුවක්ම දක්වා ඇති වටිනාකමට පිළිගත් බැංකුවකින් සේවායා නමට ලබාගත් ලංසු සුරක්ෂණයක් (2025.04.14 දක්වා වලංගු) සහිතව හෝ ගම්පහ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය වෙත මුදලින් තැන්පත් කොට ලබා ගන්නා ලදුපත ඉදිරිපත් කළ යුතුය.**ලංසු සුරක්ෂණ රහිතව ඉදිරිපත් වන ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
6. ලංසු, 2025.05.12 දින දක්වා වලංගු වේ.
7. ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, 1 වන මහල, මිරිස්වත්ත, මුදුන්ගොඩ වෙතින් ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකිය.
8. මුද්‍රා තබන ලද ලංසු, **පිටපත් දෙකකින්** යුතුව සභාපති, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, 1 වන මහල, මිරිස්වත්ත, මුදුන්ගොඩ වෙත, අවසන් දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදී ලැබීමට සැලස්විය යුතුය.කරුණාකර සෑම ලංසුවකම ඉහල වම් කෙළවරේ **ටෙන්ඩර් අංකය හා ටෙන්ඩරයේ නම** සඳහන් කල යුතුය.

9. වැඩි විස්තර සඳහා කරුණාකර දුරකථන අංක 033-2226752, 033-2221020 ඔස්සේ කාර්යාල වේලාවන්හි දී ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය අමතන්න.

**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය**
**මාර්ග සංවර්ධන අධිකාරිය - ගම්පහ**